www.asrc.org.au

Asylum Seeker Resource Centre
ABN 64114965815 • Incorporation No: A0042918

12 Batman Street, West Melbourne
Victoria 3003, Australia

t: 03 9326 6066
f: 03 9326 5199

# ඔබව සාදරයෙන් පිළිගනිමු

සරණාගත රැකවරණ ඉල්ලීම් සම්බන්ධ සම්පත් මධ්‍යස්ථානය (Asylum Seeker Resource Centre) වෙත ඔබව සාදරයෙන් පිළිගනිමු. අප ස්වාධීන මානව හිමිකම් සංවිධානයකි. අප කටයුතු කරන්නේ රජය වෙනුවෙන් නොවේ. අප උපකාර ලබා දෙන්නේ නොමිළේය. ඕස්ට්‍රේලියාවේ රැකවරණය බලාපොරොත්තුවන සරණාගතයන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමටත්, නගා සිටුවීමටත් අපි කටයුතු කරමු. සෑම දෙනාම නිදහස් අය විය යුතු බවට අපි විශ්වාස කරමු.

## අප උදව් කරන්නේ කා හටද?

අපි සරණාගත රැකවරණ ඉල්ලා සිටින අය හට උපකාර ලබාදෙමු. සරණාගතයකු යනුඃ

- සිය රටෙහි සිටීම භයානකවීම හේතුවෙන් සිය රට හැරයාමට සිදුවුණු අයෙකු; සහ
- සිය දේශපාලන මතය, ආගම, ජාතිය, ජාතිකත්වය සහ සමාජ කණ්ඩායම යන හේතු මත දරුණු ලෙස පීඩාවට පත්වීම හේ දරුණු ලෙස පීඩාවට පත්වීමේ අවදානම දැරීම හේතුවෙන් සිය රට තුල අනතුරට පත් අයෙකු; සහ
- එම දරුණු පීඩාවෙන් ආරක්ෂා කිරීමට ඔවුන්ගේ රජය හට නොහැකිවීම හෝ එසේ ආරක්ෂා නොකිරීම.

## අප විසින් ඔබ හට උපකාර කල හැක්කේ කෙසේද?

ඕස්ට්‍රේලියාවේ සරණාගතයකු බව ඔප්පු කිරීම ඔබ හට පහසු නොවේ. ඔබව සරණාගතයෙකු වශයෙන් පිළිගැනීම සඳහා අවස්ථාවක් ඇතිද යන්න සම්බන්ධයෙන් අප විසින් අවංක නීති උපදෙස් නොමිළේ ලබාදෙනු ඇත. ඔබ සරණාගතයෙකු ලෙස පිළිගැනීමට ඉඩ ඇතිය යන්න අප විසින් තීරණය කලහොත්, අප ඔබට උපකාර ලබාදෙනු ඇත. සරණාගතයෙකු වීමට කිසිවෙක් කැමති නොවන බව අපි දනිමු. කරදර සහ අවශ්‍ය අවස්ථාවලදී ඔබට උපකාර ලබාදීමට අප සිටින්නේ මෙම හේතුව නිසාය.
නීති උපදෙස්, වෛද්‍ය රැකවරණ, බෙහෙත්, ඔබගේ බිළිඳාට නැපී, දිනපතා ලබාදෙන සෞඛ්‍යය සම්පන්න දිවා ආහාර, කෑම පාර්සල්, විනෝද ක්‍රියා, උපදේශ, අර්බුද අවස්ථාවල උපකාර, ඉංග්‍රීසි පංති, ඔබට රැකියාවක් සොයා ගැනීමට සහායවීම සඳහා මෙල්බර්න් නුවර පදිංචිවීමට උපකාර කිරීම යන කරුණු ඇතුළු සෑම දෙයක් සම්බන්ධයෙන්ම අප සෑම උපකාරයක්ම ලබා දෙනු ඇත.



**අප සිටින්නේ කොහේද?**

ඔබ මෙල්බර්න් නුවර සිටින සරණාගත රැකවරණ ඉල්ලා සිටින අයෙකු නම්, සඳුදා සිට සිකුරාදා දක්වා පෙව 10 සිට පව 5 දක්වා අප මධ්‍යස්ථානය වෙත පැමිණ උපකාර ලබා ගත හැක. අප සිටින්නේ 12 Batman Street, West Melbourne යන ලිපිනයේය. මෙම වේලාවල දුරකථන අංක (03) 9326 6066 ඔස්සේද උපකාර සඳහා අප ඇමතිය හැක. අප සිටින්නේ මෙල්බර්න් නගරයේ Flagstaff Gardens පාරෙන් එපිට King Street සහ Batman Street කොනය (corner of King Street and Batman Street).

- මෙල්බර්න් නගරයේ Flagstaff හෝ Southern Cross දුම්රිය ස්ථානවල සිට මිනිත්තු 5 ක ඇවිදින දුරකි.
- මෙල්බර්න් නගරයේ city circle ට්‍රෑම් රථයේ නැග La Trobe Street සහ King Street කොන (corner of La Trobe Street and King Street) බැසගත් පසු මිනිත්තු 2 ක ඇවිදින දුරකි.

**ඔබ සිටින්නේ මෙල්බර්න් නගරයේ නොවේනම් කුමක්වේද?**

මෙල්බර්න් නුවර සිටින සරණාගතයන් හට උපකාර කිරීමට අපට හැක. ඔබ වෙනත් ප්‍රාන්තයක සිටීනම්, ඔබට ළඟම ඇති සේවාව සොයා ගැනීමට පහත ඇති සබඳතාවය (link) වෙත යන්න.

http://www.asrc.org.au/media/documents/asrc-resource-directory.pdf

ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටීනම්, ලොව පුරා සිටම සරණාගත රැකවරණ ඉල්ලා සිටින ආකාරය සොයා ගැනීමට, පහත ඇති සබඳතාවය (link) වෙත යන්න.

http://www.asylumlaw.org/asylumseeker